**සුරාබදු තෑගි අරමුදල - 2019**
**---------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු තෑගි අරමුදල 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සුරාබදු තෑගි අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සුරාබදු තෑගි අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සුරාබදු තෑගි අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සුරාබදු තෑගි අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.
- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබුවේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------------

කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ගනුදෙනු ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

------------------------------------------------------------------

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7** | | |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු. 47,134,000 ක් ලෙස දක්වා තිබුණද, එය ගොඩනැගිල්ලේ වටිනාකම පමණක් විය. එසේ වුවද ප්‍රමිත අංක 07 ප්‍රකාරව ගොඩනැගිල්ලේ පිහිටි ඉඩම සමාලෝචිත වර්ෂය දක්වාම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් පවරාගත් ඉඩම ප්‍රත්‍යාගණනය කිරීමෙන් අනතුරුව පොත් වලට ගැනීමට සටහන් කරගන්නා ලදී. | ගොඩනැගිලි පිහිටි ඉඩම විධිමත් පරිදි අයිතිය තහවුරු කරගනිමින් තක්සේරු කර ගිණුම්ගත කිරීම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවට ලැබිය යුතු සමථ ගාස්තු හා සිගරට් දඩ මුදල් ආදායමින් ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු පිළිවෙළින් රු.8,186,592 ක් සහ රු.653,325 ක් ගෙවිය යුතු ආදායම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටුයුතු කරමි. | උපචිත පදනම මත ගිණුම් පිළියෙල කිරීමට අවශ්‍ය විධිවිධාන සැලසීම. |

### 1.5.4 පැහැදිලි නොකළ වෙනස්කම්

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාණ්ඩාගාර මුද්‍රිත අනුව සමාලෝචිත වර්ෂයට අදාලව සමථ ගාස්තු ලැබීම් සහ සිගරට් දඩ ලැබීම් එකතුව රු.256,749,152 ක් වූ අතර මාසික ගිණුම් සාරාංශ අනුව එය රු.256,525,852 ක් වූයෙන් රු.223,300 ක වෙනසක් නිරීක්ෂණය විය. | ප්‍රාදේශීය කාර්යාල විසින් උපයනු ලබන සමත අයකිරීම් වැරදීමකින් පොදු තැන්පත් ගිණුමට බැර කිරීම නිසා සිදු වී ඇත. | භාණ්ඩාගාර මුද්‍රිත සහ මාසික සාරාංශ අතර සැසදීම් කිරීමට කටයුතු කිරීම. |

### 1.5.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එකතුව රු.72,393,098 ක් වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් නොකෙරුණි. | තෑගි අරමුදලේ වත්කම් පිළිබඳ වෙනමම ලේඛණයක් පවත්වා ගැනීමට කටයුතු කිරීමට උපදෙස් දී ඇත. ඒ අනුව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ගොඩනැගිල්ල පිිහිටි ඉඩම අයිතිය තහවුරු කර විධිමත් පරිදි තක්සේරුකර ගනිමින් ගිණුම්ගත කිරීම සහ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

**(අ)** සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.160,411,245 ක ඌණතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.36,759,028 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.197,170,273 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට තැගි මුදල් ගෙවීම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.262,001,814 ක ප්‍රමාණයකින් හෙවත් සියයට 258 කින් වැඩි වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. ඒ් අනුව සුරාබදු තැගි අරමුදල සඳහා ලැබෙන ආදායම නොසලකා, විධිමත් අනුමැතියකින් තොරව සහ නීත්‍යානුකූල නොවන ලෙස දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ට සමාලෝචිත වර්ෂය තුල මාස 09 ක වැටුපක් ත්‍යාග මුදල් ලෙස ගෙවා තිබීම මෙම පිරිහීමෙන් නිරූපණය කෙරේ.

**(ආ)** සුරාබදු තැගි අරමුදලේ ශුද්ධ වත්කම් ශේෂය ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී රු.160,411,245 කින් ද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි වර්ෂ අවසාන මුදල් ශේෂය රු.214,749,066 කින් ද පිරිහීමක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1994 මාර්තු දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනය ප්‍රකාරව පිහිටුවා ඇති සුරාබදු තැගි අරමුදලේ පරමාර්ථයන් ඉටුනොවීම පහත පරිදි විය. | | |
| (i) | නිලධාරීන්ගේ පුහුණු සහ අධ්‍යයන කටයුතු සඳහා සැලැස්මක් සකස් කිරීමකින් තොරව එම කාර්යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.2,500,000 ක් වෙන් කර තිබුණ ද කිසිදු පුහුණු කටයුතුතක් සංවිධානය කර නොතිබුණි. තවද, මෙම කාර්යය සඳහා ඉකුත් වර්ෂ දෙක සඳහා ද රු.මිලියන 2.5 බැගින් අනුමත වී තිබුණු ප්‍රතිපාදන ද සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | නිලධාරින් පුහුණු කිරීම සඳහා විධිමත් සැලැස්මක් සකස්කර තිබූ අතර සැලසුම් කරන ලද පාඨමාලා නොවැලැක්විය හැකි හේතුන් මත නොපැවැත්වීම, දේශකයින් සඳහා දේශන ගාස්තු ගෙවීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට නොහැකි වීම යන කරුණු කිහිපයක් හේතුවෙන් මෙම මුදල් ඉතිරි විය. ඉදිරි වර්ෂයේදී මෙම අඩුපාඩු මඟහරවා ගෙන නිවැරදිව සැලසුම් සකස් කිරීමට කටයුතු කරමි. | නිලධාරීන්ගේ ඵලදායීතාවය වර්ධනය කිරීම සඳහා වාර්ෂිකව පුහුණු වැඩසටහන් පැවැත්වීම හා තාත්ත්වික මට්ටමින් ඇස්තමේන්තු පිළියෙල කිරීම. |

<table>
<tr><td>(ii)</td><td>අරමුදලේ අරමුණක් වන ප්‍රශංසනීය වැඩ, නිර්භීත ක්‍රියා සහ විශේෂ පිළිගැනීම් සඳහා ගෙවීම වෙනුවෙන් රු.200,000 ක මුදලක් වෙන්කර තිබූ අතර මෙම වෙන් කිරීම් සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි.</td><td>ප්‍රශංසනීය වැඩ, නිර්භීත ක්‍රියා හෝ විශේෂ පිළිගැනීම් යනාදී ක්‍රියා 2019 වර්ෂය තුල කිසිවක් වාර්තා වී නොමැති අතර විශේෂ රාජකාරීන් හෝ විශේෂ වැටලීම් සඳහා 2019 වර්ෂයේදී රු.210,000 මුදලක් ගෙවා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.</td><td>අරමුදලේ අරමුණු පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීම හා තාත්වික පදනමක් මත ඇස්තමේන්තු පිළියෙල කිරීම.</td></tr>
<tr><td>(iii)</td><td>ඉදිරිපත් කරනලද කාර්ය සාධන වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ කිහිපයක සිදු කර ඇති වැටලීම් පහත පරිදි විය.
<table>
<tr><th>වර්ෂය</th><th>වැටලීම් සංඛ්‍යාව</th><th>ඉකුත් වර්ෂයට සාපේක්ෂව අඩු වීම</th></tr>
<tr><td>2019</td><td>3623</td><td>61</td></tr>
<tr><td>2018</td><td>3684</td><td>631</td></tr>
<tr><td>2017</td><td>4315</td><td>278</td></tr>
<tr><td>2016</td><td>4593</td><td>339</td></tr>
<tr><td>2015</td><td>4932</td><td>387</td></tr>
</table>
ඉකුත් වර්ෂ වලදී වැටලීම් සංඛ්‍යාව මත ලැබෙන දඩ මුදල් පදනම් කරගෙන ත්‍යාග මුදල් ගෙවනු ලැබුවද, සමාලෝචිත වර්ෂයේදී සෑම නිලධාරියෙකුටම, පැමිණීම පදනම් කරගෙන මූලික වැටුපෙන් සියයට 75 ක් ගෙවීමට තීරණය කර තිබුණි. එම හේතුවෙන් 2019 කාර්මික අපරාධ වැටලීම් සංඛ්‍යාවේ අඩුවීමක් සිදුවී තිබූ බවක් නිරීක්ෂණය විය.</td><td>කාර්මික අපරාධ වැටලීම් අඩුවීමට හේතු වී ඇත්තේ සුරාබදු නිලධාරීන් විසින් බලපත්‍ර ස්ථාන නිරන්තරව අධීක්ෂණයට ලක්කර මනා පාලනයකින් යුතුව නීත්‍යානුකූල රාමුව තුල එම ව්‍යාපාර කරගෙන යාම සඳහා බලපත්‍රධාරීන් යොමු කිරීමයි. ඒ නිසා සුරාබදු බලපත්‍ර ස්ථානවල සිදුවන සුරාබදු බලපත්‍ර වල කොන්දේසි කඩකිරීම් වල අඩුවක් දක්නට ඇත. මේ හේතුව නිසා කාර්මික වැටලීම් සංඛ්‍යාව අවම වී ඇත.</td><td>බලපත්‍ර ස්ථාන පිළිබඳව අඛණ්ඩව විධිමත් පරීක්ෂාවක් සිදු කිරීම.</td></tr>
<tr><td>(iv)</td><td>සුරාබදු නිවේදනයේ සඳහන් උපලේඛනයේ අංක 7 ඡේදය ප්‍රකාරව සමථ ගාස්තු ලැබීම් වලින් තෑගි මුදල් ගෙවීම සඳහා හිමිකම් ලබන්නේ එම ලැබීම්වලින් සියයට 75 ක ප්‍රමාණයක් සඳහා පමණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ ජූලි මස සිට දෙසැම්බර් 31 දක්වා කාලය</td><td>දෙපාර්තමේන්තුවේ රාජකාරිය කරන සියළු නිලධාරීන්ට දීමනා ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩලය සන්දේශයක් සකස්කර අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති අතර මහා භාණ්ඩාගාරය දැනුවත් කිරීමෙන් පසු මෙම දීමනාව ගෙවා ඇත.</td><td>සුරාබදු නිවේදන අංක 818 අනුව කටයුතු කිරීම.</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| | තුළ සමථ ගාස්තු ලැබීම් රු.114,250,126 ක් වුවද තැගි මුදල් ගෙවීම් රු. 290,096,694 ක් වූයෙන් සමථ ගාස්තු ලැබීම් ඉක්මවා රු. 175,846,568 ක් ගෙවා තිබුණි. | | |
| (ආ) | 2011 අගෝස්තු 01 දිනැති අංක 3/2011 දරන කාර්මික අපරාධ සම්බන්ධයෙන් වූ සුරාබදු චක්‍රලේඛය ප්‍රකාරව සමථ ගාස්තු අය කිරීම් පරාසය අනුව සමාලෝචිත වර්ෂයේ මුළු ග්‍රහණ සිද්ධි (වැටලීම්) සංඛ්‍යාවෙන් සියයට 72 ක ප්‍රමාණයක් සාමාන්‍ය වැරදි සම්බන්ධයෙන් වූ අතර ප්‍රධාන ගණයේ කොන්දේසි කඩ කිරීම් සම්බන්ධයෙන් එම ප්‍රමාණය සියයට 28 ක පමණ අඩු අගයක් ගෙන තිබුණි. | අධීක්ෂණ නිලධාරීන් වැඩිපුර යෙදීමෙන් හා නව චක්‍රලේඛ මගින් සමථ ගාස්තු ප්‍රමාණය ඉහල දැමීම තුලින් බලපත්‍ර ස්ථානවල කරන වැරදි අවම වීම, නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඉහල මට්ටමක පවතින බැවින් මෙම අඩුවීමේ ප්‍රවනතාවය දැකිය හැකිය. | ඉහළ නිලධාරීන් විසින් අහඹු තෝරාගැනීමක් සිදු කර බලපත්‍ර ලත් ස්ථාන පරීක්ෂාවට ලක්කිරීමට කටයුතු කිරීම තුලින් අසාමාන්‍ය වැරදි නොමැති බවට තහවුරු කරගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | 1999 අංක 8 දරණ දුම්කොළ බදු පනතේ 17 (අ) I හා II ඡේද අනුව ලැබෙන සිගරට් දඩ මුදලින් සියයට 25 ක කොටසකින් දුම්කොළ තැගි අරමුදලක් පිහිටුවීමට කටයුතු සිදු කළ යුතු වුවත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් එවැනි අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | දුම්කොළ අරමුදලක් පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු මේ වනවිට සම්පාදනය කරමින් පවතී. | විධිවිධාන ප්‍රකාරව දුම්කොළ තැගි අරමුදලක් පිහිටුවීම. |

**3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් වෙනුවෙන් වාර්ෂිකව ක්ෂය කරනු ලබන මුදලට සමාන මුදලක් භාණ්ඩාගාරයේ ඇති ක්ෂය සංචිත අරමුදලට බැර කරනු ලබන අතර 2019 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ | ඉදිරියේදී ඵලදායි කාර්යයන් සඳහා ක්ෂය සංචිත අරමුදලේ ශේෂය යොදවා ගැනීමට උපදෙස් ලබා දී ඇත. | ක්ෂය සංචිත අරමුදල ඵලදායි කාර්යයන් සඳහා යොදවා ගැනීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | රු.56,284,583 ක මුදලක් පැවතුනද එම අරමුදල් ඵලදායී කාර්යන් සඳහා යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | සුරාබදු තෑගි අරමුදල සඳහා ලැබෙන ආදායම නොසලකා, විධිමත් අනුමැතියකින් තොරව සහ නීත්‍යානුකූල නොවන ලෙස දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ට සමාලෝචිත වර්ෂය තුල මාස 09 ක වැටුපක් ත්‍යාග මුදල් ලෙස ගෙවා තිබීම හේතුවෙන් ඉකුත් වර්ෂයේදී රු.36,759,028 ක්ව පැවති අරමුදලේ අතිරික්තය සමාලෝචිත වර්ෂයේදී රු.160,411,245 ක ඌනතාවයක් බවට පත්වී තිබුණි. එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 258 ක පිරිහීමක් විය. | මෙසේ ගෙවීම් කිරීම සඳහා අනුමත කරගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් සකස් කර ඉදිරිපත් කර ඇති අතර පරිපාලන කාරක සභාවේ අනුමැතිය මත ගෙවීම් සිදුකර ඇත. | සුරාබදු නිවේදන අංක 818 අනුව කටයුතු කරීම හා අදාල ක්‍රමවේදය විධිමත් පරිදි සමාලෝචනය කරීම. |
| (ඇ) | 1994 මාර්තු 04 දිනැති අංක 818 දරණ සුරාබදු නිවේදනය ප්‍රකාරව සමථ මුදල් ලැබීම් හා තෑගි මුදල් ගෙවීම් අතර අනුපාතය 4 : 3 විය යුතු වුවත් සංශෝධිත ඇස්තමේන්තුව අනුව එය 1 : 1.92 ක අනුපාතයක් ලෙස අසාමාන්‍ය තත්ත්වයක් ගෙන තිබීමෙන් සුරාබදු නිවේදනයට පටහැනිව ක්‍රියා කර ඇති බවක් නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවේ සේවය කරන සියළුම කාර්ය මණ්ඩල සඳහා තෑගි අරමුදල් ගෙවීම් කිරීමට කටයුතු කිරීම හේතුවෙන් මෙසේ ඇස්තමේන්තුව අවස්ථා දෙකකදී සංශෝධනය කිරීමට සිදු වූ බව කාරුණිකව දන්වා සිටිමි. | ඇස්තමේන්තු සකස් කිරීමේදි සැලසුම් සහගතව සහ තාත්වික මට්ටමකින් නියමිත ක්‍රමවේදයකට අනුව සකස් කිරීම. |
| (ඈ) | 1994 මාර්තු 4 දිනැති අංක 818 දරණ සුරාබදු නිවේදනය ක්‍රියාත්මක වී 2019 වර්ෂය වන විට වසර 25 ක් ඉක්මවා තිබීමත් දෙපාර්තමේන්තුවේ වර්තමාන කාර්ය මණ්ඩලයේ ඒ ඒ ශ්‍රේණිවල තනතුරු හා කාර්ය භාරයේද විවිධ වෙනස්කම් සිදු වී ඇත. ඒ අනුව දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පුළුල් වීමත් සැලකිල්ලට ගෙන | මේ වනවිට 1994 මාර්තු 01 දිනැති අංක 818 දරණ සුරාබදු නිවේදනය සංශෝධනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර ඒ වෙනුවෙන් කටයුතු සිදු කරමින් පවතී. | විධිමත් පරිදි සුරාබදු නිවේදනය සංශෝධනය කිරීම. |

මෙම සුරාබදු නිවේදනය සංශෝදනය කිරීමට වගකිවයුතු පාර්ශවයන්ගේ අවධානය යොමු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය. තවද නීති විරෝධී ක්‍රියා හේතුවෙන් රාජ්‍ය ආදායමට සිදුවන අහිතකර බලපෑම අවම කර ගැනීමට හැකිවන ආකාරයට මෙම ත්‍යාග යෝජනා ක්‍රමය වැඩි දියුණු කර විධිමත් ලිඛිත ක්‍රමවේදයක් ලෙස අනුමත කරගත යුතුව පවතින බවද විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයන් හතරකට අදාලව ඇස්තමේන්තුගත වටිනාකම වූ රු. 39,700,000 ක මුදල සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබූ බව නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමණාකරන පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය. | අයවැය ලේඛණයේ ඇති විචලතාවයන් හැකිතාක් දුරට මඟහරවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | අයවැය ලේඛනය සැලසුම් සහගතව සහ තාත්වික මට්ටමකින් නියමිත කාලරාමුව තුල පිළියෙල කර ඒ අනුව කටයුතු කිරීම. |